# 14 ඒකකය
# පසු අස්වනු තාක්ෂණය

(1) ධාන්‍ය ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්ව වනුයේ,
1) අඩු වාතනය හා අඩු උෂ්ණත්වය වේ.
2) අඩු වාතනය හා අඩු ආර්ද්‍රතාවය වේ.
3) අඩු ආලෝක තීව්‍රතාවය හා අඩු උෂ්ණත්වය වේ.
4) අඩු ආලෝක තීව්‍රතාවය හා අඩු ආර්ද්‍රතාවය වේ.
5) අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය වේ. (2000)

(2) ගබඩා කිරීමේ දී වී වල තෙතමණ ප්‍රමාණය,
1) 16% ට වඩා අඩු විය යුතු ය.
2) 14% ට වඩා අඩු විය යුතු ය.
3) 12% ට වඩා අඩු විය යුතු ය.
4) 10% ට වඩා අඩු විය යුතු ය.
5) 8% ට වඩා අඩු විය යුතු ය. (2000)

(3) බීජ ගබඩා තුළට කෘමි පළිබෝධයන් ඇතුළු විය හැක්කේ,
A) උපකරණ මගිනි.
B) සේවකයන් මගිනි.
C) පැරණි ඇසුරුම් ද්‍රව්‍ය මගිනි.
D) සුළඟ මගිනි.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A හා B පමණි.
2) A හා C පමණි.
3) B හා C පමණි.
4) B හා D පමණි.
5) C හා D පමණි. (2000)

(4) පළතුරු හා එළවළු ශ්‍රේණිගත කිරීමෙන්,
1) කෘෂිකාර්මික යෙදවුම්වලට හොඳ මිලක් ලබාගත හැකි ය.
2) නිෂ්පාදිතයට ඉහළ විකුණුම් මිලක් ලබා ගත හැකි ය.
3) පළතුරු හා එළවළු මිල ස්ථාවර කළ හැකි වේ.
4) පළතුරු හා එළවළු ආදේශන සඳහා ඇති වෙළෙඳපළ ඉල්ලුම අඩු කළ හැකි ය.
5) පළතුරු හා එළවළු අනුපූරක සඳහා ඇති වෙළෙඳපළ ඉල්ලුම වැඩි කළ හැකි වේ. (2001)

(5) අස්වනු නෙළීමේ දී හා ගබඩා කිරීමේ දී වීවල අඩංගු තෙතමණ ප්‍රමාණ පිළිවෙලින්,
1) 25% හා 18% වේ.
2) 22% හා 14% වේ.
3) 22% හා 18% වේ.
4) 20% හා 16% වේ.
5) 14% හා 10% වේ. (2002)

(6) දුම් ගැසීම මගින් ගබඩා කර තබා ගන්නා කාලය (shelf life) වැඩි කළ හැක්කේ,
1) ගම්මිරිස්වල ය.
2) සුදුළූණුවල ය.
3) ඉඟුරුවල ය.
4) සාදික්කාවල ය.
5) කරාබු නැටිවල ය. (2004)

(7) සහල් නිෂ්පාදනයෙන් පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලියේ දී වැඩිම අස්වනු හානියක් සිදුවන්නේ,
1) ඇසුරුම්කරණයේ දී ය.
2) පෑගීමේ දී ය. (threshing)
3) ගබඩා කිරීමේ දී ය.
4) තැම්බීමේ දී ය. (par – boiling)
5) කෙටීමේ දී ය. (milling) (2004)

(8) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලන වැඩසටහන්වල දී විලෝපිකයන් බහුලව යොදා ගැනේ. එවැනි විලෝපියකුට උදාහරණයක් වනුයේ,
1) පැළ කීඩෑවා ය.
2) පතංගයා (locust) ය.
3) ලේඩිබර්ඩ් කුරුමිණියා ය.
4) පලතුරු මැස්සාය.
5) ගොම කුරුමිණියා ය. (2004)

(9) කරවිල, පතෝල, පිපිඤ්ඤා වැනි බෝග ගබඩා කර තැබීමේ දී දර අළු මිශ්‍ර කිරීම සාමාන්‍ය පිළිවෙතකි. මෙය කරනු ලබන්නේ,
1) බීජ සුප්තතාව පවත්වා ගැනීමට ය.
2) බීජ සුප්තතාව බිඳීමට ය.
3) හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීමට ය.
4) බීජයේ තෙතමන ප්‍රමාණය පාලනය කිරීමට ය.
5) පළිබෝධ හානි පාලනය කිරීමට ය. (2005)

(10) ධාන්‍ය ගබඩා කිරීමට වඩාත් උචිත තත්ත්ව වනුයේ,
1) මධ්‍යම උෂ්ණත්වය හා මධ්‍යම ආර්ද්‍රතාව ය. 2) මධ්‍යම උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාව ය.
3) අඩු උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාව ය. 4) අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාව ය.
5) අඩු උෂ්ණත්වය හා මධ්‍යම ආර්ද්‍රතාවය ය. (2005)

(11) පලතුරු හා එළවළු ශ්‍රේණිගත කිරීමෙන්,
A – නිෂ්පාදනය සඳහා හොඳ වෙළඳපොළ මිලක් ලබාගත හැකි වේ.
B – පලතුරුවල හා එළවළුවල වෙළඳපොළ මිල ස්ථාවර කරගත හැකි වේ.
C – පසු අස්වනු හානි අඩු කරගත හැකි වේ.
D – පසු අස්වනු සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රමය අඩු කර ගත හැකි වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,
1) A සහ B පමණ ය. 2) A සහ C පමණය. 3) A සහ D පමණය.
4) B සහ C පමණය. 5) B සහ D පමණය. (2005)

(12) පසු අස්වනු හානි අවම කළ හැකි වනුයේ,
A) නිසි අවධියේ දී අස්වනු නෙලීමෙනි. B) අස්වැන්න වර්ග කිරීමෙනි. (grading)
C) නිසි ඇසුරුම් ද්‍රව්‍ය භාවිතයෙනි. D) ගොවිපළේ දී ම විකිණීමෙනි.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) B සහ C පමණි. 3) C සහ D පමණි.
4) A,B සහ C පමණි. 5) A, B, C සහ D සියල්ලම. (2006)

(13) ගබඩාවේ දී පසු අස්වනු හානි අවම කර ගැනීමේ අපේක්ෂාවෙන් ගොවියෙක් සිය අස්වැන්නට කොහොඹ හා දෙහි කොළ එක් කළේ ය. මෙය සිදු කිරීමෙන් ඔහු අවම කර ගැනීමට අපේක්ෂා කළේ,
1) භෞතික හානි ය. 2) ජෛව රසායනික හානි ය.
3) ජෛව විද්‍යාත්මක හානි ය. 4) භෞතික හා ජෛව රසායනික හානි ය.
5) භෞතික හා ජෛව විද්‍යාත්මක හානි ය. (2006)

(14) ප්‍රවාහනයේ දී එළවලුවලට පසු අස්වනු හානි වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වනුයේ,
A) පමණට වඩා එකමත එක ගොඩ ගැසීම (over stacking) ය.
B) නුසුදුසු ක්‍රේට් පෙට්ටි භාවිතය ය.
C) අයහපත් මංමාවත් ය.
D) අධික ලෙස කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A, B සහ C පමණි.
4) A,B සහ D පමණි. 5) A, B, C සහ D සියල්ලම. (2006)

(15) පලතුරු හා එළවළු ශ්‍රේණිගත කිරීමෙන් ඒවායේ,
1) මිල පාලනය කිරීමට හැකි වේ. 2) මිල ස්ථාවර කිරීමට හැකි වේ.
3) විකුණුම් මිල වැඩිකර ගත හැකි වේ. 4) වෙළෙඳපොළ ඉල්ලුම අඩු කළ හැකි වේ.
5) පසු අස්වනු හානි වැඩි වේ. (2007)

(16) වී වල පසු අස්වනු සැකසීමේ ක්‍රියාවලියේ දී වැඩිම හානියක් වාර්තා වන්නේ,
1) අස්වනු නෙලීමේ දී ය. 2) පෑගීමේ (threshing) දී ය. 3) ගබඩා කිරීමේ දී ය.
4) වී තැම්බීමේ දී ය. 5) කෙටීමේ දී ය. (2007)

(17) දුම් ගැසීමෙන් ගබඩා කාලය (Shelf – life) වැඩ කළ හැක්කේ,
1) ගම්මිරිස්වල ය. 2) කුරුඳුවල ය. 3) ගොරකාවල ය.
4) එැණු වල ය. 5) ඉඟුරුවල ය. (2007)

(18) වී වගාවේ පසු අස්වනු හානි අඩු කිරීම සඳහා,
1) වී ඇට මේරීමට පෙර අස්වනු නෙලිය යුතු ය.
2) වර්ෂා කාලයේ අවසානයට පෙර අස්වනු නෙලිය යුතු ය.
3) නෙලාගත් වී අස්වැන්න නිසියාකාරව පිරිසිදු කළ යුතු ය.
4) අස්වනු නෙලන අවස්ථාවේ දී වී ඇටවල තෙතමන ප්‍රමාණය 13% ක් පමණ විය යුතු ය.
5) කපාගත් ගොයම් පෑගීමට පෙර පැය 24 ක් ගොඩගසා තැබිය යුතු ය. (2008)

(19) ශ්‍රී ලංකාවේ එළවලු පසු අස්වනු හානිය පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය තෝරන්න.
1) අස්වනු නෙලීමෙන් පසු කෙටි කාලයක් තුළ දී පරිභෝජනයට ගන්නා බැවින් එළවලු පසු අස්වනු හානිය එතරම් සැලකිය යුතු නැත.
2) එළවලු පසු අස්වනු හානියට ප්‍රධාන හේතුව ඒවා ක්ෂේත්‍රයේ සිට වෙළඳපොළට ප්‍රවාහනය කිරීමේ දී නොසැලකිලිමත් වීමයි.
3) එළවලු ඉතා ඉක්මනින් නරක්වන සුළු බැවින් පසු අස්වනු හානි අඩු කිරීම අපහසු ය.
4) ධාන්‍ය සමඟ සැසඳීමේ දී එළවලු පසු අස්වනු හානිය අඩු ය.
5) එළවලු පසු අස්වනු හානිය කෙරෙහි පෙර අස්වනු රෝග හා පළිබෝධ පාලනයේ කිසිම බලපෑමක් නැත. (2008)

(20) පසු අස්වනු හානිය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නිෂ්පාදනයේ ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇත. මෙය අවම කළ හැක්කේ,
A – නිසි පරිණත අවධියේ දී අස්වනු නෙලීමෙනි.
B – ගොවිපළ තුළදීම අලෙවි කිරීමෙනි.
C – උචිත ඇසුරුම් ද්‍රව්‍ය භාවිත කිරීමෙනි.
D – කෘෂි රසායනද්‍රව්‍ය භාවිතයෙනි.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A හා B පමණි. 2) A හා C පමණි. 3) A හා D පමණි.
4) B හා C පමණි. 5) B හා D පමණි. (2009)

(21) වී නිෂ්පාදනයෙහි පසු අස්වනු සැකසුම් ක්‍රියාවලියේ දී වැඩිම අස්වනු හානියක් සිදුවන්නේ,
1) ගොයම් පෑගීමේ දී ය. 2) ගබඩා කිරීමේ දී ය. 3) වී තැම්බීමේ දී ය.
4) සහල් කෙටීමේදී ය. 5) ඇසිරීමේ දී ය. (2009)

(22) පත්‍රමය එළවළු කෙටි කාලයකට ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්වය / තත්ත්ව වනුයේ,
1) වැඩි උෂ්ණත්වය හා වැඩි සාපෙක්ෂ ආර්ද්‍රතාව ය.
2) අඩු උෂ්ණත්වය හා අඩු සාපෙක්ෂ ආර්ද්‍රතාව ය.
3) අඩු උෂ්ණත්වය හා වැඩි සාපෙක්ෂ ආර්ද්‍රතාව ය.
4) – 20°C උෂ්ණත්වයේ ගබඩා කිරීම ය.
5) නිදහසේ වායු සංසරණය වන පරිසරයක ගබඩා කිරීම ය. (2010)

(23) ශ්‍රී ලංකාවේ එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය පිළිබඳව, වඩාත් නිවැරදි වගන්තිය වනුයේ.
1) පසු අස්වනු හානියට ප්‍රධානම හේතුව අධික ලෙස පොහොර යෙදීම ය.
2) පෙර අස්වනු සාධක නිසි පරිදි හැසිරවීමෙන් පසු අස්වනු හානි නැති කරගත හැකි ය.
3) එළවලු හා පලතුරුවල පසු අස්වනු හානියට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ අයෝග්‍ය හැසිරවීම (handling) ඇසිරීම සහ ප්‍රවාහනය ය.
4) දුර්වල මහා මාර්ග තත්ත්වය නිසා, ප්‍රවාහණයේ දී සිදුවන පසු අස්වනු හානිය අඩු කළ නොහැකි ය.
5) ගොවීන්ට වඩා හොඳ ගබඩා පහසුකම් ලබාදීමෙන් එළවලු සහ පලතුරුවල පසු අස්වනු හානිය අවම කරගත හැකි ය. (2010)

(24) පලතුරු පසු අස්වනු තාක්ෂණයේ දී, වායු හෝ දියර ආකාරයෙන් එතිලීන් යොදා ගන්නේ,
1) ගබඩා කාලය දීර්ඝ කිරීමට ය. 2) පලතුරු ඉදවීමට ය.
3) පළිබෝධ හා රෝගවලින් ආරක්ෂා කිරීමට ය. 4) නිෂ්පාදිතයෙන් අපද්‍රව්‍ය ඉවත් කිරීමට ය.
5) රසය වැඩි කිරීමට ය. (2011)

(25) ගබඩා කළ වී වල ජීව කාලය වැඩි කර ගැනීම සඳහා බහුලව යොදා ගැනෙන පූර්ව – අස්වනු හා පසු – අස්වනු ක්‍රම වනුයේ පිළිවෙලින්,
1) වාරි ජලය කපා හැරීම හා වර්ග කිරීම ය.
2) වාරි ජලය කපා හැරීම හා හිරු එළියේ වියළීම ය.
3) කෘෂි රසායන භාවිතය නැවැත්වීම හා හිරු එළියේ වියළීම ය.
4) කෘෂි රසායන භාවිතය නැවැත්වීම හා හුළං කිරීම ය.
5) කෘෂි රසායන භාවිතය නැවැත්වීම හා පොලි බෑග්වල ඇසිරීම ය. (2012)

(26) පසු අස්වනු හානි අවම කළ හැක්කේ,
A – නිසි අවධියේ දී අස්වනු නෙලීමෙනි.
B – නිසි ඇසුරුම් ද්‍රව්‍ය භාවිතයෙනි.
C – ගොවිපළ තුළ දී අලෙවි කිරීමෙනි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි. 2) B පමණි. 3) C පමණි. 4) A හා B පමණි. 5) B හා C පමණි. (2013)

(27) අස්වනු නෙලීමට සුදුසු අවස්ථාවේ බෝගයේ පරිණත මට්ටම එක් එක් බෝගයකට අනුව වෙනස් වන අතර, එය එහි පසු අස්වනු හානිවලට බලපායි. නිසි අස්වනු නෙලන අවස්ථාවේදී අර්ධව වර්ධනය වූ ඵල හා සම්පූර්ණයෙන වර්ධනය වූ ඵලවලට උදාහරණ වනුයේ පිළිවෙලින්.

1) පිපිඤ්ඤා හා තක්කාලි වේ.
2) ඇපල් හා තක්කාලි වේ.
3) පිපිඤ්ඤා හා බණ්ඩක්කා වේ.
4) ඇපල් හා බණ්ඩක්කා වේ.
5) බණ්ඩක්කා හා පිපිඤ්ඤා වේ. (2014)

(28) ගබඩා කර ඇති බීජවල ආයු කාලය සඳහා බලපාන වඩාත් වැදගත් සාධක දෙක වනුයේ,

1) වර්ෂාපතනය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවයි.
2) බීජවල ප්‍රමාණය සහ තෙතමන ප්‍රමාණයයි.
3) දේශගුණය සහ උෂ්ණත්වයයි.
4) සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වයයි.
5) ආලෝකය සහ බීජයේ තෙතමන ප්‍රමාණයයි. (2015)

(29) නෙලාගත් වී ගබඩා කිරීමට පෙර නිසි පරිදි වියළා **නොගැනීම** නිසා පහත කරුණු හේතු කොටගෙන පසු අස්වනු හානි සිදුවන බව ශිෂ්‍යයෙක් ප්‍රකාශ කරයි.

A – කෘමි ආසාදන B – දිලීර ආසාදන C – ප්‍රරෝහණය

ඉහත පිළිතුරු අතුරෙන් නිවැරදි වන්නේ,

1) A පමණි
2) B පමණි
3) A හා B පමණි
4) A හා C පමණි
5) B හා C පමණි (2015)

(30) ලොකු ළූණුවල පසු අස්වනු හානිය සහ සම්බන්ධ සාධක කිහිපයක් පහත දක්වේ.

A – නෙලා ගන්නා ලද ළූණු ශ්‍රේණිගත කිරීම සහ තෝරා ගැනීම.
B – ළූණු ගබඩා කර ඇති ගබඩාව තුළ සාපේක්ෂ ආර්ද්‍රතාව උච්චාවචනය වීම.
C – ගබඩා කාලයේ දී ළූණු ප්‍රරෝහණය වීම.
D – වගා කාලයේ දී ක්ෂේත්‍රය තුළ දුර්වල ජල කළමනාකරණයක් පැවතීම.
E – ළූණුවල සිටින ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය

ඉහත සාධක අතුරෙන් පෙර අස්වනු, අභ්‍යන්තර සහ බාහිර ලෙස සැලකිය හැක්කේ පිළිවෙළින්

1) D, E සහ A ය.
2) B, A සහ C ය.
3) D, C සහ B ය.
4) E, B සහ C ය.
5) D, E සහ B ය. (2016)

(31) වීදි දෙපස විවෘත රාක්කවල තබා වෙළඳාම් කරන පලතුරුවල පසු අස්වනු හානි සිදුවීමට වඩාත් ම බලපාන හේතු වනුයේ,

1) ප්‍රමාණය ඉක්මවා ගොඩ ගැසීම සහ භෞතික හානි වේ.
2) හිරු එළියට නිරාවරණය වීම සහ අධික උෂ්ණත්වය වේ.
3) දූවිලි සහ වාහනවල දුම් මගින් අපවිත්‍ර වීම වේ.
4) විවිධ වර්ගයේ පලතුරු එකට ගොඩ ගසා තිබීම වේ.
5) ක්ෂුද්‍රජීවීන් මගින් අපවිත්‍ර වීම සහ දුර්වල සනීපාරක්ෂක තත්ත්ව වේ. (2017)

(32) පලතුරුවල පසු අස්වනු තාක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A – පලතුරු නිසි පරිණත අවස්ථාවේ දී නෙළිය යුතු ය.
B – නෙළීමෙන් පසු සුදුසු දිලීර නාශකයක් යෙදිය යුතු ය.
C – වැඩිපුර ඇති තෙතමනය අඩු කිරීම සඳහා පලතුරු නෙළීමෙන් පසු එක් දිනක් සූර්යාලෝකයට නිරාවරණය කළ යුතු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,

1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ B පමණි.
5) B සහ C පමණි. (2017)

## 14 ඒකකය

## පසු අස්වනු තාක්ෂණය

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 5 | (2) | 2 | (3) | 2 | (4) | 2 | (5) | 2 | (6) | 2 | (7) | 3 | (8) | 3 |
| (9) | 5 | (10) | 4 | (11) | 2 | (12) | 4 | (13) | 3 | (14) | 3 | (15) | 3 | (16) | 3 |
| (17) | 3 | (18) | 3 | (19) | 2 | (20) | 2 | (21) | 2 | (22) | 3 | (23) | 3 | (24) | 2 |
| (25) | 2 | (26) | 4 | (27) | 1 | (28) | 4 | (29) | 5 | (30) | 3 | (31) | 2 | (32) | 1 |